## 13 ශ්‍රේණිය ගිණුම්කරණය 4 වන සතිය - මැයි 25 සිට 29 දක්වා

## 14.7 පොදුකාර්ය පිරිවැය (හැඳින්වීම සහ වර්ගීකරණය)

පොදුකාර්ය පිරිවැය හැඳින්වීම.

කිසියම් නිෂ්පාදන ඒකකයක් සම්බන්ධයෙන් පැහැදිලිව වෙන්කර හඳුනා ගත නොහැකි (සමහර අවස්ථාවන්හි හඳුනා නොගන්නා) එනම් නිෂ්පාදන ඒකක කිහිපයක් වෙනුවෙන් පොදුවේ වැය කළ සම්පත්වල ආර්ථික වටිනාකම පොදුකාර්ය පිරිවැය ලෙස හඳුන්වයි.

පොදුකාර්ය පිරිවැය වර්ග කිරීම.

නිෂ්පාදන පිරිවැයේ කොටසක් ලෙස සැලකෙන පොදුකාර්ය පිරිවැය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ලෙස ද එලෙස නොසලකන පිරිවැය නිෂ්පාදන නොවන පොදුකාර්ය පිරිවැය ලෙස ද වර්ග කරයි. තවද පොදුකාර්ය පිරිවැය වක්‍ර ද්‍රව්‍ය, වක්‍ර ශ්‍රමය හා වක්‍ර වෙනත් වශයෙන් ද වර්ගකර දැක්වේ.

පොදුකාර්ය පිරිවැය බොද දැක්වීමේ අවශ්‍යතාවය

ඍජු පිරිවැය මෙන් පොදුකාර්ය පිරිවැය නිෂ්පාදන ඒකක සමඟ පැහැදිලිව හඳුනාගත නොහැකි වුවත් ඒකකයක පිරිවැය සෙවීම වැනි කළමනාකරණ ගිණුම්කරණ කාර්යයන් සඳහා පොදුකාර්ය පිරිවැය නිෂ්පාදන ඒකක අතර බෙදා දැක්වීමේ අවශ්‍යතාවක් පවතී.

ඇගයීම

(1) පහත ප්‍රකාශනයන් සත්‍ය ද අසත්‍ය ද යන්න වගුවේ දක්වා ඇති පරිද සම්පූර්ණ කරන්න. පළමු අයිතමය ඔබගේ පහසුව සඳහා සිදුකර ඉදිරිපත් කර ඇත.

| පිරිවැය අයිතමය | සත්‍ය අසත්‍ය බව |
|---|---|
| ඍජු අමුද්‍රව්‍ය පොදුකාර්ය පිරිවැයෙහි කොටසක් ලෙස සලකයි. | අසත්‍ය |
| කම්හල් කළමනාකරුගේ වැටුප පොදුකාර්ය පිරිවැයෙහි කොටසක් වේ. | |
| කම්හල් රක්ෂණය පොදුකාර්ය පිරිවැය සේ සලකනු ලැබේ. | |
| නිෂ්පාදන පුරස්කාරය පොදුකාර්ය පිරවැය ලෙස සලකයි. | |
| නිෂ්පාදනයන් බොදාහැරීමේ පිරිවැය පොදුකාර්ය පිරිවැය ලෙස සලකයි. | |

(2) ඇඟළුම් කර්මාන්ත ශාලාවක පහත එක්එක් පිරිවැය අයිතමයන් එම ඇඟළුම් කර්මාන්ත ශාලාව විසින් නිපදවන ඇඟළුමක පිරිවැය ගණනය කරීමේදී නිෂ්පාදන පොදකාර්ය පිරවැය යටතේ වර්ග කර්නේද නැතිද යන්න පහත වගු සටහනේ පරිදි සම්පූර්ණ කර දක්වන්න. පළමු අයිතමය ඔබ විසින් කළ යුතු දෑ පැහැදිලි වන පරදි සිදුකර දක්වා ඇත.

| පිරිවැය අයිතමය | නිෂ්පාදන පොදුකාර්ය පිරිවැය ලෙස | |
|---|---|---|
| | සලකයි | නොසලකයි |
| ඇඟළුම් නිපදවීම සඳහා යොදාගනු ලබන රෙදි අමුද්‍රව්‍ය | | ✓ |
| නිෂ්පාදන ඒකක මත ගෙවනු ලබන නිෂ්පාදන සේවක වේතන | | |
| නිෂ්පාදනාගාරයේ ගොඩනැගිලි කුලී | | |
| තත්ත්ව පාලිකාවන්ගේ මාසික වැටුප් | | |
| කම්හල් සුපරීක්ෂක වේතන. | | |
| ඇඟළුම් සඳහා භාවිත කර ඇති බොත්තම් වල පිරිවැය. | | |
| ඇඟළුම් මැසීම සඳහා වැයවූ නූල් වල පිරිවැය. | | |
| ඇඟළුම් ගබඩාකිරීමේ පිරිවැය | | |
| ඇඟළුම්, ගැනුම්කරුවෙත ප්‍රවාහනය කිරීමේ පිරිවැය | | |

**ශාන්ත විතාරණ මයා,ර/ෆර්ගසන් උසස් විද්‍යාලය.**